# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2273/86 - 2022 අප්‍රේල් මස 01 වැනි සිකුරාදා - 2022.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**අතිගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි**

මුද්‍රාව

**ගෝඨාභය රාජපක්ෂ**

ශ්‍රී ලංකාවේ මහජන හදිසි අවස්ථා තත්ත්වයක් පැවතීම හේතුකොට ගෙන මහජන ආරක්ෂාව සහ රටේ යථා පැවැත්ම සුරක්ෂිත කිරීම හා මහජන ජීවිතයට අත්‍යාවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යෑම සඳහා මෙසේ කිරීම අවස්ථානුකූල යැයි මා අදහස් කරන හෙයින් ;

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මම, 1959 අංක 8 දරන පනතින් සහ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් සංශෝධිත (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඒ ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව මුළුල්ලේම දෙදහස් විසි දෙකක් වූ අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු යයි මේ ප්‍රකාශනයෙන් ප්‍රකාශ කරමි.

වර්ෂ දෙදහස් විසි දෙකක් වූ අප්‍රේල් මස 01 වන දින කොළඹ දී අත්සන් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**ගාමිණී සෙනරත්,**
ජනාධිපති ලේකම්.

EOG 04 - 0009